ආචිරිගම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා

කළමනාකරණ සැලැස්ම



කෘෂිකර්ම අමාත්‍යාංශය

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය – වයඹ පළාත



Medawachchiya Cascade in Nawagattegama DSD
80°0'0"E
80°1'30"E
80°3'0"E
80°4'30"E
Landuse Types
3893
3166
2670
1071
718
598
30
29
4000
3500
3000
2500
2000
1500
1000
500
0
ACRES
Scrub
Forest
Chena
Paddy
Home Garden
Tank
Rock
Coconut
LAND USE TYPES
Nawagattegama DSD &
Part of Karuwalagaswewa DSDs
Part of Karuwalagaswewa DSD
Nawagattegama DSD
Kuda Medawachchiya
Samurdhigama
Miyellewa1
Tharanagahawewa
1:300,000
Palu Siyambalawa Wewa
Pahalagama Wewa
Pahala Kuruketiyawa Wewa
Kadurugoda Wewa
Kadurugoda Wewa
Samurdhigama
Mahamadawachchiya Wewa
Kebellagoda Wewa
Kuda Medawachchiya
Ihala Kuruketiyawa Wewa
Pahala Kuththikulama Wewa
Halmillewa Wewa
Talgas Wewa
Miyellewa1
Sengakkulama Wewa
Ihala Tutti Kulam
Tharanagahawewa
Athurupolayagama Wewa
Sandanam Kulam
Tammennawetiya Wewa
Sadanam Kulam
Pichchandiyawa Wewa
Wale Wewa
Gallewa Wewa
Legend
Drianage
Foot Path
Main Road
Secondary Road
Cart Road
GNDs
Coconut
Chena Cultivation
Forest
Home Garden
Undefined
Paddy
Rock
Scrub
Tank
0
1
2
4
Km
1:60,000
Data Source :- Department of Survey
Compiled By :- Mr. Sampath Arunashantha
(Sampathgeo@kln.ac.lk)

Infinix HOT PLAY

පටුන

01.හැඳින්වීම 4

1.1 ආවිරිගම එල්ලංගාව හා එහි පිහිටීම.. 4

1.1.1. ග්‍රාමනිලධාරී කොට්ඨාශ මට්ටමින් ආවිරිගම එල්ලංගාව.............................. 5

1.1 2.ආවිරිගම එල්ලංගා පද්ධතියේ සිතියම 6

1.1.3 ආවිරිගම එල්ලංගාව හා එහි ව්‍යාප්තිය... 7

1.1.4 එල්ලංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු... 7

1.1 5.එල්ලංගාවේ වැව් පිලිබඳ සිතියම් හා තොරතුරු... 9

1.1.6 එල්ලංගාවේ වැවේ ධාරිතාව හා කුඹුරු ප්‍රමාණය 10

1.2 ආවිරිගම එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම 12

1.3 එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම... 12

1.4 එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය 14

1.5 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය 14

1.6 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී අනුගමනය කල යුතු ක්‍රමවේදය.. 14

1.7 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු.................. 16

1.8 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම 17

02.එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය.......................... 18

2.1 ආවිරිගම එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම.. 18

0 3.ආවිරිගම එල්ලංගාවේ පැතිකඩ 20

3.1 භූගෝලීය(Geographical) හා භූ විද්‍යාත්මක (Geological) තොරතුරු 20

3.2 ජල විද්‍යාත්මක තොරතුරු ....**Error! Bookmark not defined.**

3.3 මාසිකව හා වාර්ෂිකව එල්ලංගාවට ලැබෙන වර්ෂාපතනය.........**Error! Bookmark not defined.**

3.4 පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු... 21

3.5 එල්ලංගාව තුළ සිදුවන මානව ජීවනෝපාය ක්‍රියාකාරකම්.. 22

3.6 එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු 24

3.7 එල්ලංගාවේ පවතින ඉදිකිරීම් 26

3.8 එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව 29

04.එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය 32

4.1 එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග.. 33

4.2 හඳුනාගත් ගැටලු අතරින් සැලකිල්ලට භාජනය කළ උග්‍ර ගැටලු.. 35

4.3 ආවිරිගම හරස්කඩ චාරිකාවෙන් හදුනාගත් ප්‍රමුඛතාගත කල ගැටලු හා යෝජිත උපාය මාර්ග හා සැලැස්ම.. 38

0 5.එල්ලංගා කළමනාකරණයේ මූලික සැලැස්ම 44

5.1. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය තුල එමගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන ක්‍රියාකාරකම් 45

5.2.එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය 46

ඇතුලත් වගු

වගුව අංක 01 - ග්‍රාමනිලධාරී කොට්ඨාශ මට්ටමින් ආවිරිගම එල්ලංගාව

වගුව අංක 02 - එල්ළංගාව පිළිබද සාමාන්‍ය තොරතුරු

වගුව අංක 03 - එල්ලංගාවේ වැවේ ධාරිතාව හා කුඹුරු ප්‍රමාණය

වගුව අංක 04 - මාසිකව එල්ලංගාවට ලැබෙන වර්ෂාපතනය

වගුව අංක 05 - හදුනාගත් ගැටලු අතරින් සැලකිල්ලට භාජනය කළ උග්‍ර ගැටළු

වගුව අංක 06 - එල්ලංගා කළමණාකරන කමිටුව විසින් උග්‍ර ගැටළු විසඳා ගැනීම හෝ අවම කිරීම සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම්

වගුව අංක 07 - ආවිරිගම ක්‍රියාත්මක සැලැස්ම

ඇතුලත් වන රූප සටහන්

රූපය අංක 01 - ආවිරිගම එල්ලංගා පද්ධතියේ සිතියම

රූපය අංක 02 - ආවිරිගම එල්ලංගාව හා එහි ව්‍යාප්තිය

රූපය අංක 03 - එල්ලංගාවේ වැව් පිලිබද සිතියම් හා තොරතුරු

රූපය අංක 04 - එල්ලංගා කළමනාකරණයට අදාළ ආයතනික රාමුව

රූපය අංක 05 - එල්ලංගාවේ පවතින ඉදිකිරීම් (වැව)

රූපය අංක 06 - එල්ලංගාවේ පවතින ඉදිකිරීම් (කුඹුරු යාය)

රූපය අංක 07 - සයිමන් නවගත්තේගම මහතාගේ අනුස්මරණ ශාලාව

රූපය අංක 08 - ඉපනැල්ලේ මුං වගාව

රූපය අංක 09 - තුඹ කරවිල වගාව

ඇතුලත් වන ප්‍රස්ථාර

ප්‍රස්ථාර අංක 01 - එල්ලංගාව තුළ ජනගහනය

ප්‍රස්ථාර අංක 02 - එල්ලංගාව තුල ජනතාවගේ රැකියා

ප්‍රස්ථාර අංක 03 - එල්ලංගාව තුල ජනගහනය ගැහැනු, පිරිමි ගණත්වය

ප්‍රස්ථාර අංක 04 - එල්ලංගා අශ්‍රිතව ජනතාවගේ ආගමික පසුබිම

ප්‍රස්ථාර අංක 05 - එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව

01.හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයකි. එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ මෙම මාහැඟි අමිල නිර්මාණයක් වන එල්ලංගාව සංරක්ෂණය කර මනා කළමණාකරනයක් තුලින් “දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ” සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කළමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කළමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කළමණාකරනය කිරීම එල්ලංගා කළමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම ක්‍රියාව පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කළමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කර ඇත. එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමයි.

1.1 ආච්චිරිගම එල්ලංගාව හා එහි පිහිටීම

නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල එල්ලංගා 03 ක් පිහිටා ඇත. මැදවච්චිය, ආච්චිරිගම හා පහල වගයාමඩුව එම එල්ලංගා වේ. මෙම එල්ලංගා වල පිළිවෙලින් 20, 37 හා 16 වශයෙන් වැව් පිහිටා ඇත. ආච්චිරිගම හා පහල වගයාමඩුව එල්ලංගා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් මැනුම් කලද ඒවා දැනට පුණරුත්ථාපනය නොවේ. පුත්තලම් දිස්ත්‍රික්කයේ නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නවගත්තේගම ගොවිජන සේවා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 04 ක් ආවරණය කරමින් ආච්චිරිගම එල්ලංගාව මුහුදු මට්ටමේ සිට අඩි 203 ක උන්නතාංශයකින් පිහිටා ඇත. ආච්චිරිගම එල්ලංගාව මී ඔය ද්‍රෝණියේ පිහිටා ඇති අතර මෙම එල්ලංගාව පවත්නා එල්ලංගා අතරින් විශාලම එල්ලංගාව වේ.

ගොවි සංවිධාන (FOs) 15 ක් සහ (GN) ග්‍රාම නිලධාරී කොට්ඨාශ 04 කින් එල්ලංගාව ආවරණය කරයි. ආච්චිරිගම එල්ලංගාව වැව් 37 කින් සමන්විතය. ව්‍යාපෘතිය ආරම්භයේදී වැව් 08 ක් ප්‍රතිසංස්කරණය සඳහා ව්‍යාපෘතිය මගින් තෝරාගෙන ඉදිකිරීම් ආරම්භ කර ඇත. මෙම එල්ලංගාව හෙක්. 3278 කින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ ශුෂ්ක දේශගුණික කලාපයට අයත් මෙම එල්ලංගාවේ සාමාන්‍ය උෂ්ණත්වය 28 - 32 ^{o}C අතර පවතී. උෂ්ණත්වය වර්ෂයේ වැඩිම කාලයක් තුළ දක්නට ලැබෙන අතර මාර්තු, අප්‍රේල්, ජූලි, අගෝස්තු, සැප්තැම්බර් මාස වලදී මෙම තත්වය ඉතා ඉහළ මට්ටමක පැවතීම විශේෂයෙන් කැපී පෙනේ. ආච්චිරිගම එල්ලංගාවට ඊසාන දිග මෝසම් සමයේ වැඩිම වර්ෂාවක් ලැබෙන අතර නිරිත දිග මෝසම් සමයේ ලැබෙන වර්ෂාපතනය ඉතා සීමිතය. ඊට අමතරව සංවහන වැසි මඟින් ද මෙම එල්ලංගාවට වර්ෂාපතනය ලැබේ. ආච්චිරිගම එල්ලංගාවේ ඓතිහාසික පසුබිම ගත්කල මුල්ගිරිගල රජමහ විහාරස්ථානය පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වේ. පස්වන දප්පුල රජතුමා විසින් ඉදි කරන ලද කටාරං සහිත ගල්ලෙන තුළ පැරණි විහාර මන්දිරයක් ඉදි කර ඇත. ක්‍රි .පූ 2 - 5 ශතවර්ෂ වලට අයත් රළපනාව ගෝටපබ්බත වෙහෙර ගල රජමහා විහාරය සාලිය අශෝක මාලා යුගය වෙත දිවෙයි. කටාරං සහිත ගල්ලෙන් 9 ක් සහ තවත් ගල් ලෙන් 17 ක් පිහිටා ඇත.

1.1.1 ග්‍රාමනිලධාරී කොට්ඨාශ මට්ටමින් ආචිරිගම එල්ලංගාව

අංක	ග්‍රාම නි. කොට්ඨාශයේ නම හා අංකය	ජනගහනය			ප්‍රදේශය තුල ගොවි සංවිධාන
		ස්ත්‍රී	පුරුෂ	එකතුව	
01	කිරිමැටියාව- 644	986	885	1871	04
02	මියැල්ලෑව - 644/3	657	645	1302	05
03	රඹකනයාගම - 644/1	601	590	1191	03
04	මුල්ලේගම - 645/3	594	622	1216	03
	එකතුව			5580	15

වගුව - 01

1.1.2 ආචිරිගම එල්ලංගා පද්ධතියේ සිතියම

රූපය - 01



1.1.3 ආවිරිගම එල්ලංගාව හා එහි ව්‍යාප්තිය

රූපය - 02



1.1.4 එල්ලංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු

වගුව - 02

තොරතුරු	විස්තරය
දිස්ත්‍රික්කය	පුත්තලම
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	නවගත්තේගම
මැතිවරණ බල ප්‍රදේශය	ආණමඩුව
ගංගා ද්‍රෝණියේ නම	මී ඔය ද්‍රෝණිය
එල්ලංගාවේ නම	ආවිරිගම
ගොවිජන සේවා බල ප්‍රදේශය	නවගත්තේගම
ග්‍රාම නිලධාරී වසම්	කිරිමැටියාව, මීයැල්ලෑව, රඹකනයාගම,

	මුල්ලේගම
එල්ලංගාවේ මුලු භූමි ප්‍රමාණය හෙක්:	හෙක්. 3278
පැහැදිලි ජල පෝෂක සංඛ්‍යාව	15
කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන වැව් සංඛ්‍යාව	25
වනාන්තර ප්‍රදේශ	හෙක්. 181.2
මුඩු බිම්	හෙක්. 48 (හදුනාගත්)
එල්ලංගාව තුල ජීවත්වන පවුල් සංඛ්‍යාව	1379
ගෙවතු	හෙක්. 909.2
පුනරුත්ථාපනයට යොමු කල වැව් සංඛ්‍යාව	08
පුනරුත්ථාපනයට යොමු නොකල වැව් සංඛ්‍යාව	29

1.1.5 එල්ලංගාවේ වැව් පිළිබඳ සිතියම් හා තොරතුරු

රූපය - 03



1.1.6 ආච්චිරිගම එල්ලංගාවේ වැවේ ධාරිතාව හා කුඹුරු ප්‍රමාණය

වගුව - 03

අනු අංකය	වැවේ නම	ග්‍රා.නි. වසම	ජලධාරිතාවය (අක්කර අඩි)	කුඹුරු (හෙක්)	ගොවීන් සංඛ්‍යාව
01	නවගත්තේගම වැව	කිරිමැටියාව	312	62	59
02	තල්ගස් වැව		250	50	64
03	කලවැල්ලැව වැව		280	56	32
04	ඉහල අලුත් වැව		64	13	11
05	පහල අලුත් වැව		30	06	04
06	තරණගොඩ වැව		60	12	15
07	බුළුපෙත් වැව		25	05	01
08	පට්ටලේ වැව		0	0	0
09	වෙම්බු වැව		0	02	0
10	ලෝලුගොඩ වැව		20	0	0
11	මියල්ලැව වැව	මියල්ලැව	145	24	43
12	ආච්චිරිගම වැව		105	21	21
13	පහල බෝගහ වැව		200	40	37
14	හීනාගම වැව		207	0	35
15	බමුණුගම වැව		0	15	25
16	තිඹිරිපොකුණ වැව		0	07	01
17	ගොවි පල්ලිය වැව		50	06	10
18	රඹකනයාගම වැව	රඹකනයාගම	112.5	22.5	32

19	ගල්ලෑව වැව		360	72	83
20	ඉහළ පලුගස්වැව වැව		60	12	16
21	කිරලබොක්ක වැව		35	07	10
22	ගණන්කැටේ වැව		125	25	15
23	කොලොන්ගස් වැව		35	07	19
24	කෝන් වැව		55	11	20
25	වීරගස් වැව		30	05	18
26	පහළ පලුගස්වැව		0	10	09
27	දිවුල්ගස් වැව		30	06	09
28	බෝගස් වැව		20	04	04
29	හීන් ඉලපත්තෑව වැව		0	0	0
30	මහ මුල්ලේගම වැව	මුල්ලේගම	0	23	23
31	පත්පොල වැව		0	09	07
32	පලුගස් වැව		0	0	02
33	අනාත වැව		0	0	02
34	වීහාර වැව		0	0	23
35	පන්සල් වැව		0	0	02
36	ගල්වලේ වැව		0	0	0
37	ගල් වංගුව වැව		0	0	0

මූලාශ්‍රය - PRA වාර්තාව 2020 නවගත්තේගම.

1.2 ආවිරිගම එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම

ආවිරිගම එල්ලංගාව හෙක්ටයාර් 3278 කින් සමන්විතය. වැව් 37 කින් යුක්ත වේ. මෙම වැව් අතරින් 08 ක් ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කෙරේ. ඉතිරි වැව් ද පුනරුත්ථාපනයට භාජනය කල යුතුව ඇත. මෙම පද්ධතිය තුල කුඹුරු හා අතිරේක ආහාර බෝග වගාව අක්කර 3741 කි. මෙම වගා කටයුතු වල නිරතවන ගොවීන් සංඛ්‍යාව 3300 කි. මේ සමගම එල්ලංගාව තුල සමස්ථ ජනගහනය 5580 කි. මෙම සියලු දෙනා එල්ලංගාව තුල විවිධ මානුෂික ක්‍රියාකාරකම් වල නිරතවේ. මේ අනුව එල්ලංගාව දැනටමත් විශාල හායනයකට පත්ව ඇත. කාලයක් තුල සිදුවී ඇති වන විනාශය හේන් වගාව පාංශු ඛාදනය වැනි හේතූන් නිසාම වැව් හා ඇල පද්ධතිය ගොඩවීම නිසා එල්ලංගාව බලවත් තර්ජනයකට මුහුණ දෙමින් සිටී. වැව් වල ජලය සීග්‍රයෙන් සිඳී ගොස් ඇත. ජල මාර්ග සිදී ගොස්ය. දේශගුණික විපර්යාසයන් අනුව මෙම තත්වය තවදුරටත් උග්‍රවනු ඇත. මෙම තත්වයෙන් මෙම එල්ලංගා පද්ධතිය බේරා ගැනීමට නම් වැව් පුනරුත්ථාපනය පමණක් කොහෙත්ම ප්‍රමාණවත් නොවේ. මෙම තත්වයට එකම විසඳුම වන්නේ සමස්ථ එල්ලංගාවම තිරසර සංවර්ධනයකට භාජනය කිරීමයි. ඒ අනුව එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස් කර ආවිරිගම එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ අවධානය යොමු කර ඇත. එහිදී එල්ලංගා කළමනාකරණ කමිටුව එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස් කර ඒ මගින් ක්‍රියාත්මක විය යුතුය.

1.3 එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වැව් කළමනාකරණයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කළමනාකරණ ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එකතු වී සකස් වී ඇත. එනම් "එල්ලන්" සහ "ගාව" යන්නයි. එල්ලන් යනු එල්ලෙන යන්නයි. ගාව යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි. ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. එල්ලංගා කළමනාකරණ කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සහ එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීමට, නීතිගත කිරීමට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව එල්ලංගා කළමණාකරන කමිටු 53ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කළමනාකරණ කමිටු 53ක් පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.

එල්ලංගා කළමනාකරණ කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

ඒවා නම්,

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ප්‍රාදේශීය ලේකම්වරු
- ගොවි සංවිධාන
- ප්‍රජා මූලික සංවිධාන

- ජල සම්පත් මණ්ඩලය
- ආපදා කළමණාකරන කාර්යාංශය
- පොලිස් දෙපාර්තමේන්තුව
- ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
- පරිසර අධිකාරිය
- පෞද්ගලික අංශය
- ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව

යන ආයතන වේ. එල්ලංගා කළමනාකරණ කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ප්‍රජා මූල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇත. ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහනේ දක්වා ඇත.

රූපය - 04

එල්ලංගා කළමනාකරණයට අදාළ ආයතනික රාමුව

1.4 එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය

මෙරට ඒකාබද්ධ කළමණාකරණ වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන් මහවැලි ව්‍යයාපාරය හා ඉන්මාස් වැඩ සටහන ප්‍රමුඛතාවය ගනී. මෙම වැඩසටහන් ජලය හා බැදුනු මහා වාරිමාර්ග පදම් කරගත් ව්‍යාපාර වේ. මෙම වැඩසටහන් අතුරෙන් 1984 ආරම්භ වූ ඉන්මාස් වැඩසටහන (මහා වාරිමාර්ග පුණරුත්ථාපන වැඩ සටහන - MIRP හා වාරිමාර්ග පද්ධති කළමනාකරණ වැඩ සටහන් - ISMP ව්‍යාපෘති) වැදගත් තැනක් ගනු ලබන්නේ එයද ලෝක බැංකුවේ අනුග්‍රහයෙන් මෙරට ක්‍රියාත්මක වී අද දක්වාම සාර්ථකව ක්‍රියාත්මක වන බැවිනි. මෙරට මහ ගොවි ජනපද ව්‍යයාපාර වල ගොවි සංවිධාන පිහිටු වීමේ ආරම්භක පියවරක් ගනු ලැබුවේ මෙම ඉන්මාස් වැඩ සටහන තුලින්ය. මෙම ගොවි ජනපද ව්‍යයාපාර කළමනාකරණය කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව මගින් සිදු වේ. මෙම එල්ලංගාව කළමනාකරණය කිරීම ද එල්ලංගා කළමනාකරණ කමිටුව මගින් ඉටු කිරීමට ලෝක බැංකුව අපේක්ෂා කරයි. ඉහතින් කියවෙන ව්‍යයාපාර කළමනාකරණ කමිටුව හා මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බොහෝ දුරට සමානකම් දක්වයි. මෙහි කළමනාකාරිත්වය රජයේ නිලධාරින්ගේ හා එල්ලංගාවේ ප්‍රතිලාභීන් හවුල් කරගෙන හවුල් කළමනාකරණයක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. ඉහත අංක 1.4 දරණ ජේදයට අනුව මෙම එල්ලංගා කළමනාකරණ කමිටුවේ අන්තර්ගතය විග්‍රහ කර ඇත. ඉතා වේගවත්ව හායනයට යමින් පවතින ලෝක උරුමයක් ලෙස හදුනාගෙන ඇති එල්ලංගාව නැවතත් තිරසරව පවත්වාගෙන යාමට මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බෙහෙවින් ඉවහල් වනු ඇත.

1.5 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා අතීතයේ පැවති ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික වත් පිලිවෙත්, සම්ප්‍රදායන් හා වාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් විය. වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කළමනාකරණයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිලිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ වාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කර ඇත. මෙම පැතිකඩ එල්ලංගා පද්ධති කළමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි. එය එල්ලංගාවේ පවතින තත්වය අවබෝධ කර ගැනීමට මහත් පිටුවහලකි. එමෙන්ම ඉදිරි සැලසුම් සඳහා මග පෙන්වීමකි.

1.6 එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ දී අනුගමනය කල ක්‍රමවේදය

ආචිරිගම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ දී පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබීය. එල්ලංගා කළමණාකරණ කමිටුවේ විශේෂ රැස්වීමක දී එල්ලංගා පැතිකඩක අවශ්‍යතාවය හා ඒ තුලින් එල්ලංගා සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය සාකච්ඡාවට ගනු ලැබීය. එම පැහැදිලි කිරීම් අනුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ සියලු සාමාජිකයින් මෙම හරස්කඩ වාරිකාව සංවිධානය කිරීමට එකගතාවය පල කරන ලදී. ඉන් අනතුරුව එල්ලංගා කළමණාකරණ කමිටුවේ නියෝජිතයන් හා ගොවි සංවිධාන නියෝජිතයන් සමග එල්ලංගා හරස්කඩ වාරිකාව සැලසුම් කරන ලදී. මේ සඳහා යෝජිත දිනය ලෙස යොදා ගනු ලැබුවේ 2024 .05 .21 දිනයයි. මෙම වාරිකාව කණ්ඩායම් 6 කින් යුක්ත විය.

2024.05.21 දින වැඩසටහන

කණ්ඩායම් කිරීම.

- 01 කණ්ඩායම

  මහසෙන් ගොවි සංවිධානයේ මග පෙන්වීම යටතේ ආව්රිගම වැව (ගමන් මග දුර කි.මී. 2.5 කි.) හා ඊට අදාල වැවේ රක්ෂිත ප්‍රදේශ.

- 02 කණ්ඩායම

  මහසෙන් ගොවි සංවිධානයේ මග පෙන්වීම යටතේ ගොවිපල්ලියවැව අදාල වැවේ රක්ෂිත ප්‍රදේශ (ගමන් මග දුර කි.මී. 2 කි.)

- 03 කණ්ඩායම

  කිරිමැටියාව ගොවි සංවිධානය මග පෙන්වීම යටතේ කිරිමැටියාව වැව හා අදාල වැවේ රක්ෂිත ප්‍රදේශ (කි.මී. 3 කි)

- 04 කණ්ඩායම

  මියල්ලෑව ගොවි සංවිධානය මග පෙන්වීම යටතේ පහලබෝගහ වැව අදාල වැවේ රක්ෂිත ප්‍රදේශ (කි.මී. 3.3 කි)

- 5 කණ්ඩායම

  මියල්ලෑව ගොවි සංවිධානය නායකත්වය යටතේ මියල්ලෑව වැව අදාල වැවේ රක්ෂිත ප්‍රදේශ (කි.මී. 2.3 ක දුර කි)

- 6 කණ්ඩායම

  ස්වර්ණ හීනාගම එක්සත් ගොවි සංවිධානය නායකත්වය යටතේ හීනාගම වැව අදාල වැවේ රක්ෂිත ප්‍රදේශ (කි.මී. 3.2 ක දුර කි)

මෙම සැලැස්ම අනුව ආවිරිගම එල්ලංගා පද්ධති චාරිකාව කිලෝ මීටර් 16.3 කින් යුක්ත විය. මේ ගොවි සංවිධාන සමඟ නිලධාරි කණ්ඩායම් අනුයුක්ත කරවිය. මෙම තොරතුරු සරළ රේඛාවක් මත ගමන් කිරීමෙන් නොව නියමිත වැව පදනම් කරගත් බහු ආශ්‍රයක් තුල නිරීක්ෂණය කරමින් ලබා ගත් දත්ත විය. මෙදින ලබාගත් දත්ත නැවත එල්ලංගා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර එම දත්ත වල නිවැරදිතාවය සටහන් කර ගැනීමට ලබා ගන්නා ලද අතර ගමන් මාර්ගයේ භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක තොරතුරු, ජල විද්‍යාත්මක තොරතුරු, පරිසර විද්‍යාත්මක තොරතුරු, සමාජ ආර්ථික තොරතුරු සම්පත් භායනය හා සම්පත් භායනයේ බරපතලකම පිලිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කර ගන්නා ලදී. හරස්කඩ චාරිකාව සඳහා ප්‍රතිලාභීන් ගොවි සංවිධාන සාමාජිකයින් හා සියලු රාජ්‍ය ආයතන වල නිලධාරීන් සහභාගී වූ අතර චාරිකාවෙන් පසුව ඒ සඳහා සහභාගී වූ සියලු පාර්ශව වල සහභාගීත්වයෙන් වැඩමුළුවක් පවත්වා තොරතුරු වල නිරවද්‍යතාවය තවදුරටත් තහවුරු කරගන්නා ලදී. විශේෂයෙන්ම මෙම එල්ලංගා පැතිකඩේ ඇති තොරතුරු එල්ලංගා කළමනාකරණ මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත් වූ අතර එල්ලංගාව අධ්‍යනය කරනු ලබන අයට එල්ලංගාව පිලිබඳව තොරතුරු ලබා ගැනීමේදී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධන සැලසුම් කිරීමේදී බෙහෙවින් ඉවහල් වනු ඇත.

1.7 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කළමනාකරණ වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කළමනාකරණ ය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීමට එල්ලංගා පැතිකඩ සහ කළමනාකරණ සැලැස්මක් සකස් කරනු ලැබේ. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ (Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපාය මාර්ගික මැදිහත් වීම්, ඒ සඳහා වන දළ වියදම් ඇස්තමේන්තුවක්, ක්‍රියාත්මක කිරීමේ කාල වකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු පාර්ශවකාර ආයතන යන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කළමනාකරණ මූලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

1.8 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමනාකරණ මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එලිපෙහෙලි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හානියට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමනාකරණ මූලික සැලැස්ම බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවීන්ට එල්ලංගාව පිලිබඳව නිවැරදි චිත්‍රයක් දැකීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් මෙම වාර්තාව වැදගත් වේ. එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමනාකරණ මූලික සැලැස්මක් සැකසීම (Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කළමනාකරණ සැලැස්ම එල්ලංගා කළමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කර ඇත .

02. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

ආව්රිගම එල්ලංගාවේ පවතින තත්වය දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා එල්ලංගා කළමණාකරන කමිටුවේ අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීමට සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කළමණාකරන සැලැස්මක් අවශ්‍ය බවද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කළමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක අවශ්‍යතාවය දැනෙන්නට විය. මේ අනුව එල්ලංගාව අධ්‍යනය කිරීමටත් දත්ත හා තොරතුරු එක් රැස් කරමින් එල්ලංගා පැතිකඩක් සකස් කිරීමටත් අවශ්‍ය විය. පිලිවෙලින් එල්ලංගාව අධයනය කිරීම හා ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය. එහිදී එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූ විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහු පාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත විශ්ලේෂනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන් මගින් ඒවායේ නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(i) රැස්වීම් පැවැත්වීම
(ii) ද්විතීය දත්ත එකතු කිරීම
(iii) හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම
(iv) එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම
(v) එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම
(vi) එල්ලංගා පැතිකඩ සැකසීම
(vii) ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම, යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම
(viii) එල්ලංගා සැලැස්ම සැකසීම
(ix) පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම
(x) එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දල ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන (Medium Term) හා දීර්ඝකාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු එල්ලංගා කළමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරන සැලැස්මට ඇතුලත්වේ.

2.1 ආව්රිගම එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම

ආව්රිගම එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමනාකරණ සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ කාර්යයන් අතර එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක එල්ලංගා පද්ධති 53ක් ආවරණය වන පරිදි එල්ලංගා කළමණාකරන කමිටු 53ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කළමනාකරණ කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා

කළමනාකරණ සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි .එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ. ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම, දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරීම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කළමනාකරණ සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශීලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධයනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගා හරහා චාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී

ඒවා නම්,

1. භූගෝල විද්‍යාත්මක
2. භූ විද්‍යාත්මක
3. ජල විද්‍යාත්මක
4. පාරිසරික විද්‍යාත්මක
5. මානව හැසිරීම්
6. සමාජ ආර්ථික
7. කෘෂිකාර්මික
8. වාරිමාර්ග කළමණාකරණ
9. පෝෂිත ප්‍රදේශයේ තත්වය

යන ආදියයි. මේවා එල්ලංගා කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිලිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාරකරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

03 ආවිරිගම එල්ලංගාවේ පැතිකඩ

3.1 භූගෝලීය (Geological) තොරතුරු

ආවිරිගම එල්ලංගා පද්ධතිය සාමාන්‍ය රැළි භූමියකින් යුක්තය. මෙම භූ විශමතාවය අනුව නැගෙනහිර සිට බටහිර දිශාභිමුඛව කිරිමැටියාව, මියැල්ලැව, මුල්ලේගම සහ රඹකනයාගම ගම්මාන හරහා මදක් ගමන් කර උතුරු දිශාවට එල්ලංගාව ගලා බසී. විශාල උස් කඳවැටි හෝ පහත් බිම් දක්නට නැත. නැගෙනහිර දිසාවේ කිරිමැටියාව වැවෙන් ඇරබෙන ආවිරිගම එල්ලංගාවේ ජලය නරි ඔය ඔස්සේ ගොවි පල්ලිය වැව හා ආවිරිගම වැව දක්වා පැමිණ තබ්බෝව ජලාශය පෝෂණය කරයි. මුහුදු මට්ටමේ සිට අඩි 200 ක පමන උන්නතාංශවකින් පිහිටා ඇති ආවිරිගම එල්ලංගාව උතුරින් ගිරිබාව ප්‍රදේශිය ලේකම් කොට්ඨාසයෙන් ද, දකුණින් ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, නැගෙනහිරින් ගල්ගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් ද, බටහිරින් කරුවලගස් වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද සීමා වී ඇත. ආවිරිගම එල්ලංගාවේ භූමියේ පිහිටීම අනුව මධ්‍යස්ථ ප්‍රමාණයේ රතු බොරලු මිශ්‍ර පසකින් යුක්තය. ආවිරිගම එල්ලංගාව ආසන්නයෙන් ගල් තලාවක් ද පිහිටා ඇති අතර කිරිමැටියාව වැවෙන් ආරම්භ වන වෙල් පහත් ජලය හා නාන්නේරිය හා අවට වැව් වලින් පෝෂණය වන නරි ඔය ප්‍රදේශය හරහා ගලායන ප්‍රධාන ජල මූලාශ්‍රයයි. පවතින වැව් බොහොමයත් විධිමත් නඩත්තවක් සිදු කල බවක් නොපෙන්වයි. ජලජ පැලෑටි හා ආක්‍රමණශීලී ශාක වලින් වැව් පද්ධතිය වැසී ඇත. අනවසර ඉඩම් වගාවට යොදාගෙන ඇති බවක් පෙනෙන්නට ඇත. මේ නිසා එල්ලංගාවේ පාංශු ඛාදනයට මෙය හේතු වී ඇත. ප්‍රදේශයේ පවතින අලි උවදුර හා වෙනත් සතුන්ගෙන් වගාවන් හා ජන ජීවිතය ආරක්ෂා කර ගැනීමට ගන්නා වූ විවිධ ක්‍රමවේදයන් අතරට අලි කානු කැපීම දැකිය හැකිය. මෙම ක්‍රමවේදය නිසා භූමියේ පවතින භූ දර්ශනය හා වැසි සමයේ ජලධාරාවන්ගේ ගලායාමේ වෙනස්කම් දැකගත හැකිය.

3.2 භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

එල්ලංගාවේ වැව් ලේඛණය අනුව වැව් 37 කි. ඉහත සිතියමට අනුව නරි ඔයේ ඉතා වැදගත් පෝෂිත ප්‍රදේශයක් වශයෙන් ආවිරිගම එල්ලංගාව හැදින්විය හැකිය. මෙහි සංවහන වැසි වැටෙන විටදී කලු මිශ්‍ර දුඹුරු පැහැයෙන් යුත් පැහැදිලි ජලය ගලා යන අතර වගා කන්න වලදී වගා බිම් සැකසීමත් සමග ගලායන ජලයේ වර්ණය වෙනස් වේ. එල්ලංගාවේ වැව් ලේඛණය අධ්‍යනය කිරීමේ දී එල්ලංගාවේ පවත්නා ජල ධාරිතාවය අක්කර අඩි 2590 කි. වැව් 14 ක ජලය නොමැත. තවද වැව් 10 ක වගා නොකරන බව ඉහත ලේඛණයෙන් පෙනේ. තවත් වැව් දෙකක ගොවීන් නැත. මේ අනුව මෙම එල්ලංගාවේ අත්හැර දමන ලද වැව් පවතින බවත් මෙම කලාපය මුල්ලේගම ග්‍රාම නිළධාරි වසමත් පෙන්නුම් කරයි. මෙම එල්ලංගාව පවතින වැව් බොහොමයක් ම කුලු වැව් හා ඔලගම් වැව් වලින් යුක්තබව මෙම දත්ත අනුව නිගමනය කලහැක. එල්ලංගාව තුල ගම්මාන හා ඊට සමගාමීව සිදුකෙරෙන ඉදිකිරීම් දක්නට ලැබේ. නගරය අවට පවතින වැව් ආශ්‍රිතව තාවුල්ල හා රක්ෂිත භූමි අල්ලා ගැනීම බහුලව දැකගත හැක.

3.3. පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු

ආච්රිගම එල්ලංගාව අවට පිහිටා ඇති වනාන්තර වර්ග ලෙස වියළි විවෘත වනාන්තර හා කටු පඳුරු සහිත ලඳු කැලෑ බහුලව දැකිය හැකි වේ. මෙහි විශාල ප්‍රමාණයේ ශාක වර්ග වශයෙන් සියඹලා, මයිල, පලු, වීර, දිවුල්, කරඳ හා කුඹුක් වැනි ශාක විශේෂ බහුලව පවතී. පඳුරු වශයෙන් අන්දර හා එරමිණියා බහුලව දැකගත හැකිය. මීට අමතරව මෙම එල්ලංගාවේ ශ්‍රී ලංකානු අලියා, දිවියන්, මුවන්, වල් මීහරකුන්, වල් ඌරන්, වඳුරන්, මොණරුන් වැනි සතුන්ද ඉත්තෑවන්, මීමින්නන් වැනි කුඩා සතුන්ද දැකිය හැක. තවද උරග විශේෂ ලෙස තලගොයා, කබරගොයා, ගැට කිඹුලා, හැල කිඹුලන් හා සර්ප විශේෂ ලෙස නයා, පිඹුරා, පොළඟා, ඇහැටුල්ලා, වල් ගැරඬියා, අහර කුක්කා, මාපිලා, තෙල් කරවලා වැනි සතුන්ද කටුසු වර්ග ලෙස පලා කටුස්සා, ගරා කටුස්සන්, අං කටුස්සන් හා බෝදිලිමා වැනි විශේෂද හූනු විශේෂ ලෙස සුලභ ගේ හූනන්, තිත් හූනන් හා කිඹුල් හූනන් හමුවේ. මෙම ප්‍රදේශයේ දුර්ලභ ගනයේ පක්ෂීන් විශේෂ ලෙස අළු කොහා, සිලිබිල්ලා, නිල් කිතලා, ලතුවැකියා, රත්මල් කිරලා දැකිය හැක. තවද කැබැල්ලෑවන්, හම්බාවන් යන සත්වයින් ද එල්ලංගාව තුල ජීවත් වේ.

වැව් ආශ්‍රිතව මානව ක්‍රියාකරකම් හා පරිසර හානි විශාල වශයෙන් සිදුවේ. නමුත් මෙම වන රක්ෂිතය තුල සිදුවන මානව ක්‍රියාකාරකම් හා පරිසර හානි වන සංරක්ෂණ නිළධාරීන් යම් ප්‍රමාණයකට පාලනය කරගෙන යනු ලබයි. මෙම එල්ලංගාව තුල ඉතා විශාල වැව් ප්‍රමාණයක් හා කුඹුරු ප්‍රමාණයක් පවතී. පැහැදිලි එල්ලංගාවක ලක්ශණ මෙම එල්ලංගාවේ නිරික්ෂණය වේ. වැව් වල කුඹුරු ඉඩම් වලට පසුව නැවත පහලින් පවතින වැවෙහි ඉස්මත්ත ආරම්භ වේ.

රූපය 04 - වැවේ කට්ට කඩුව නොමැත.

මෙම කලාප දෙක එකිනෙක වෙන්කර හඳුනාගැනීමට පවා අපහසුය. පැහැදිලි මායිම් නොමැති වීම නිසා වැවේ තාවුල්ල දක්වාම කුඹුරු අස්වද්දා ඇත.

වැව් තාවුල්ල තුල ගස් ගොම්මන, පෙරණය, ගොඩ වල දක්නට නොලැබේ. මේ නිසා වර්ෂාකාලයේදී වැව් පිටාර ගැලීමෙන් ඉවත්වන වතුර ඇල මාර්ගයක් ඔස්සේ (Tail cannel) පහල වැව් වලට ගලා ඒම සිදුවේ. මේ හේතුවෙන් එල්ලංගාවේ පහලින් පවතින වැව් පස සෝදායාම මගින් ගොඩවීම දක්නට ලැබේ.

තවද වැව් ඉස්මත්ත දක්වා කුඹුරු අස්වද්දා ඇති නිසා කුඹුරු සීසාන අවදියේදී කුඹුරුවල අතිරික්ත බොර ජලය පස් අංශු සමග වැවට මුදාහැරීම නිසා වැව් ගොඩ වීම තව දුරටත් සිදු වේ. උදාහරණ ලෙස නවගත්තේගම වැව, මියල්ලෑව වැව, හීනාගම වැව දැක්විය හැක. මීට අමතරව අනෙකුත් වැව් වලද ඉස්මත්තේ හා ඉහල ප්‍රදේශයේ හේන් වගාව හා අනෙකුත් වගා කටයුතු පාංශු සංරක්ශණ ක්‍රම භාවිතා නොකරන නිසා වැව් ගොඩවීම දක්නට ලැබේ.

තවද එල්ලංගාව තුල නිදැල්ලේ සැරිසරන ගව රංචු හා වසරේ යම් කාල වල පැමිණෙන වල් අලි නිසා එල්ලංගාවේ පවතින වැව් වල බැම් වලට හානි සිදුවේ. වල් ඌරන් හා රිලවුන්ගේ ගහනය එල්ලංගාව තුල අධිකව පවතී. මීට අමතරව එල්ලංගාව තුල ගඩොල් කැපීවීම, බොරලු ඉවත් කිරිම, වැලි සේදීම යන මානව ක්‍රියාකාරකම් දක්නට ලැබේ.

3.4 ජල විද්‍යාත්මක තොරතුරු

ආච්රිගම එල්ලංගාව ආරම්භයේ දී පැහැදිලි ජල පෝෂක මාර්ගයක් දක්නට නොලැබේ. එහෙත් වැව් පිහිටීමේ රටාව හා භූමියේ පවතින උන්නතාංශය අනුව එල්ලංගාවට ලැබෙන වැසි ජලය වැව් වලට ගලාගොස් පවතින කුඩා දිය පහරවල් හා ඇල මාර්ග වැසි ජල රටාව අනුව සක්‍රිය වේ. මෙසේ එක්රැස් වන ජලය පිළිවෙලින් එල්ලංගාවේ වැව්වලට පැමිණ කුඩා වැව් පිටාර යාමත් සමඟ ආච්රිගම වැවට එක්රැස් වේ. ප්‍රදේශයේ පැහැදිලි වැව් 37 ක් පවතින අතර තවත් ඉතා කුඩා වැව් 06 කින් පමණ යුක්තය. මෙම වැව් සක්‍රිය වීමත් සමඟ වී වගාව ආරම්භ වේ. සියළුම ගොවීන් වී වගාව අපේක්ෂා කරයි .

3.5 මාසිකව එල්ලංගාවට ලැබෙන වර්ෂාපතනය

	Average Monthly Rainfall (mm)												
Month	Anamaduwa Dispensary	Atharagalla	Dewahuwa	Giribawa	Inginimitiya	Karandipooval	Kottukachchiya	Maha Uswewa	Mahagalkadawala	Mediyawa Tank	Puttalam	Siyambalangamuwa	Tabbowa Irrigation
Jan	46	48	124	49	68	44	36	44	72	85	49	58	49
Feb	35	30	96	35	46	40	32	34	49	52	40	51	35
Mar	84	61	73	45	64	57	83	61	72	104	54	50	70
Apr	176	153	176	123	196	120	167	151	199	214	136	152	151
May	122	82	85	70	79	91	114	86	86	105	94	65	106
Jun	47	17	29	13	19	25	47	18	17	39	27	12	34
Jul	21	9	21	8	18	13	25	10	20	22	10	16	17
Aug	35	27	27	21	29	15	33	26	35	37	20	26	30
Sep	71	56	64	57	74	57	60	52	84	77	68	62	62
Oct	269	233	280	192	233	227	262	221	239	297	241	227	234
Nov	225	235	288	174	225	219	238	225	241	265	238	231	202
Dec	129	140	258	122	158	131	118	138	165	176	136	142	116

වගුව - 05

(සම්පත් පැතිකඩ නවගත්තේගම.)

ප්‍රදේශයට මාසිකව ලැබෙන වර්ෂාපතනය ඉහත වගු ව තුලින් දක්වා ඇත. මෙම සටහන් අනුව එල්ලංගාව ආසන්නයේම මහ උස්වැව වැසි මාන තොරතුරු අනුව ඉතා අවම වර්ෂාපතනයක් මෙම වසර තුල දක්වා ඇත. ඇතැම් ගොවීන් තම අභිප්‍රාය අනුව ජලය ලබාගැනීම නිසා විධිමත් ජල පාලනයක් සිදු නොවේ. සියලුම වැව්වල වගා කටයුතු අඛණ්ඩව සිදු නොකරන බැවින් ඒවායේ ක්‍රියාකාරීත්වයද දුර්වල වී ඇත.

විශේෂයෙන්ම සෑම වැවකම පාහේ අඛණ්ඩ නඩත්තුවක් සිදු නොවන අතර වගා කරන කන්න වල පමණක් ඇළවල් සුද්ධ වේ. මේ නිසා බොහෝ වැව් කණ්ඩි වල හා ඇළවල් වල විශාල ගස් වැවී ඇත. එහෙත් කන්න රැස්වීමේ නීතිරීති අනුව නඩත්තු කටයුතු ඉටුවන බව නිලධාරින්ගේ මතය වී ඇත. ඇල පද්ධතිය ඉතා අබලන්ය. මේ නිසා යම් ක්‍රමානුකූල ජල කළමනාකරණයක් සිදු කල නොහැකිය. ඇතැම් ඇලමාර්ග කුණු ඇලට ජලය හරවා කුණු ඇල පුරවා කුඹුරු වලට ජලය හරවා ගැනීමට ගොවීන් කටයුතු කරයි. ඒ අනුව ජල කළමනාකරණයක් පිළිබදව කථා කිරීමට පෙර පද්ධතිය නිසි පරිදි අලුත්වැඩියා කලයුතුය.

3.6 එල්ලංගාව තුළ සිදුවන මානව ජීවනෝපාය ක්‍රියාකාරකම්

සාමාන්‍ය ජනගහනයක් පවතින ආචිරිගම එල්ලංගාවේ මුළු ජනගහනයෙන් 51%ක් කාන්තා ජනගහනය වන අතර 49% ක් පිරිමි ජනගහනය වේ. මුළු ජනගහනයෙන් 33% පමණ වයස අවුරුදු 18ට වඩා අඩු වන අතර රැකියා නියුක්ත ජනගහනයෙන් 70%ක් පමණම කෘෂිකර්මාන්ත ආශ්‍රිතව ජීවනෝපාය සිදු කරයි.



ප්‍රස්ථාර අංක 01

එමෙන්ම,

6% - රාජ්‍ය සේවකයින්

6% - ආරක්ෂක අංශයේ රැකියා නියුක්තිකයන්

2% - පෞද්ගලික අංශයේ රැකියා නියුක්තිකයන්

1% - ව්‍යායාපාරික ප්‍රජාව

1% - විදේශ රැකියා කරන්නන්

2% - දෛනික වැටුප් ලබන්නන්

7% - ස්වයංරැකියා නියුක්තිකයන්

0.3% - කිරි ගව පාලනයේ නියුතු වන්නන් වේ.

ඒ අනුව ප්‍රධාන මානව ක්‍රියාකාරකම් ලෙස ගොඩ හා මඩ ගොවිතැන හඳුනාගත හැක.



ප්‍රස්ථාර අංක - 02

මීට අමතරව ස්වයංරැකියාවල නියුක්ත පිරිසක්ද ප්‍රදේශය පුරා ව්‍යාප්තව ජීවත්වන අතර නිමි ඇඳුම් කර්මාන්තය, පෙදරේරු කර්මාන්තය, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන, වඩු කර්මාන්තය, කළුගල් කැඩීම වැනි කර්මාන්ත ද ජීවනෝපාය ක්‍රම ලෙස භාවිතා කරයි. එල්ලංගාව තුළ බොහෝ විට ගෙවතු වගාවක් දක්නට ලැබේ. ඒ සඳහා භූගත ජල සම්පත් යොදාගෙන ඇත. සතුන් දඩයම් කිරීම එල්ලංගාව තුළ අප්‍රසිද්ධියේ සිදු වේ. ඌරන්, මුවන් දඩයම් කරන බවත් එම මස් හොර රහසේම අළෙවි කරමින් මුදල් උපයා ගන්නා බවට තොරතුරු ලැබී ඇත. ගඩොල් කැපීම හෝ සේදීම එල්ලංගාව තුළ ස්ථාන කිහිපයකම සිදු වේ.

3.7 එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු

එල්ලංගාව අයත් වන ග්‍රාම නිලධාරී වසම් හතරෙහි පවුල් සංඛ්‍යාව

644-කිරිමැටියාව - 569

644/3-මියල්ලෑව - 463

644/1-රඹකනයාගම - 465

645/3-මුල්ලේගම - 410

වන අතර මුලු පවුල් සංඛ්‍යාව 1032 ක් වේ. මෙහි සමස්ථ ජනගහනය 5580 පමණ වන අතර ඉන් 51% (2838) ගැහැණු ද, 49%(2742) පිරිමි ද වේ.



ප්‍රස්ථාර අංක - 03

ආචිරිගම එල්ලංගාවේ 98.3% බෞද්ධ ජනතාව වන අතර 1.4% කතෝලික හා 0.6% ක් හින්දු ආගමික ප්‍රජාව වේ.



Data Sources: PRA Results 2019/2020 by Janathakshan, Resource Profile of Nawagaththegama DSD 2019

ප්‍රස්ථාර අංක - 04

මෙම එල්ලංගාව තුළ මුල් යුගයේ ඉතා සීමිත ජනගහනයක් පදිංචිව ඇත. මුල් යුගයේ සාර්ථකව කුඹුරු වගා කර ගත් බවත් ජලය ප්‍රමාණවත් වූ බවත් පැරණි ගොවීන් පවසයි. එහෙත් වර්තමානයේ මෙම තත්වය සීග්‍රයෙන් වෙනස් වී ඇත. වැවෙහි ජලය රඳා පැවතීමක් නැත. පෝෂක ප්‍රදේශ වියළී ගොසින්ය. ජල මාර්ග හිදීගොස් ඇත. ඉඳි, තල් වැනි ශුෂ්කකාමී ශාක හා පඳුරු වර්ධනය වෙමින් පවතී. රජයේ විවිධ ආධාර වැඩසටහන් ව්‍යාපෘති මගින් ප්‍රදේශයේ ජනතාවට සුළු වශයෙන් සහන ලබා සලසනු ලබයි. නියමිත කන්නයේ කුඹුරු 100% වගා කළ නොහැකිය. අතීතයේ පැවති තාවකාලික නිවාස හා ජනාවාස ක්‍රමයෙන් වැඩිදියුණු වී ඇත.

අනු අංකය	ග්‍රාම නිල. වසම	ස්ථිර නිවාස (ගඩොල්, සිමෙන්ති, උළු, තහඩු)			අර්ධ ස්ථිර නිවාස (මැටි හෝ ලී බිත්ති හෝ පොල්අතු)	තාවකාලික නිවාස (පැල්පත්)	වෙනත්	මුළු නිවාස ගණන
		මුළු ගණන	වැඩ නිම කළ	අඩක් නිම කළ				
01	644-කිරිමැටියාව	482	362	120	04	-	01	487
02	644/3-මියල්ලෑව	366	334	32	12	04	-	382
03	644/1-රඹකනයාගම	339	322	17	04	02	-	345
04	645/3-මුල්ලේගම	316	242	74	09	0	0	325

වගුව - 06

(සම්පත් පැතිකඩ - නවගත්තේගම.)

ස්ථිර නිවාස ඉදිවෙමින් පැවතිය ද වර්තමානයේ මෙම තත්ත්වය පසුබා ඇත. එල්ලංගාවේ සෑම ප්‍රදේශයකටම පාහේ විදුලිය හා පානීය ජල ලැබී ඇත.

3.8 එල්ලංගාවේ පවතින ඉදිකිරීම්

එල්ලංගාව තුළ වැව් 37 ක් පමණ ඇත. මේ අතුරෙන් වැව් 08 ක් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කිරීමට සැලසුම් යොදා ඇත. එල්ලංගාව තුළ අලි මිනිස් ගැටුම ඉතා බරපතලය.

රූපය 05 - කන්න ආරක්ශිත වගා වැට

මේ සඳහා විසඳුමක් වශයෙන් අලි වැට ඉදිකර ගැනීමට ප්‍රජාව උත්සාහ දරයි. සෑම වගා ඉඩමකම උඩ පැලක් හා අලි වැටක් ඉදිකර ඇත. කුඹුරු යායවල් ආරක්ෂා කර ගැනීම සඳහා දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් කන්න ආරක්ෂිත වගා වැට එල්ලංගාවේ ගොවි සංවිධාන සඳහා ලබා දී ඇත.

ප්‍රදේශයේ ජනතාවගේ නිවාස සහ කුඩා ව්‍යාපාර ස්ථාන වලට අමතරව එල්ලංගාව තුල දක්නට ලැබෙන විශේෂ ඉදිකිරිම් ලෙස ප්‍රවීණ ලේඛකයෙකු වන සයිමන් නවගත්තේගම මහතාගේ අනුස්මරණ ශාලාව ප්‍රධාන ස්ථානයක් ගනී.

රූපය - 06

කිරිමැටියාව විහාරස්ථානය, කිරිමැටියාව පෙර පාසල, නවගත්තේගම සමෘද්ධි බැංකුව, නවගත්තේගම ජාතික පාසල , ආදී පොදු ස්ථාන හඳුනාගත හැක.

ප්‍රදේශයේ පානීය ජල අවශයතාවය සපුරාගැනීම සඳහා ඉදිකළ ප්‍රජාමූල ජල යෝජනා ක්‍රමය හඳුනා ගත හැක. ඊට අමතරව ගොවිතැන සඳහා අවශ්‍ය ජලය සපයා ගැනීමට කෘෂි ළිං 25ක් පමන දක්නට ලැබේ.

3.9 එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව

ප්‍රදේශයේ කෘෂිකාර්මික රටාව ලෙස මහ කන්නය වැසි ජලය උපයෝගී කරගෙනද, යල කන්න වැව් හා කෘෂි ළිංවල ජලය කළමනාකරනය කරමින් ද සිදු කරන අතර යල කන්නයේ වී වගාව බහුලව සිදු කරන අතර හේන් වගාවද සිදු කරයි. නමුත් යල කන්නයේ දී සමහර වැව් ආශ්‍රිතව යල බෙද්ම ක්‍රමයට වගා කටයුතු සිදු කරන අතර බොහෝ විට අතිරේක බෝග වගාව සිදු කරයි. එල්ලංගාවේ මහා වාරි 55%, සුලු වාරි 34%, වැසි ජලයෙන් 11%ක් පමණ වගා කරයි.



ප්‍රස්ථාර අංක - 05

රූපය 07 - ඉපනල්ලේ මුං වගාව

රූපය 08 - තුඹ කරවිල වගාව

අතිරේක බෝග ලෙස බඩ ඉරිඟු, රට කජු, මුං ආදියද පළතුරු ලෙස කෙසෙල්, පැණි කොමඩු අදිය ද ඊට අමතරව පොල් වගාව ද ප්‍රදේශය තුල දක්නට ලැබේ. එල්ලංගාව තුළ ගොවීන් යල මහ කන්න දෙකට අමතරව අතර මැදි කන්නක් ද වගා කටයුතු සිදු කරයි. බොහෝ දුරට අතරමැදි කන්නයේ දී වගා කරන්නේ මුං බෝගයයි. දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් මෙම ප්‍රදේශ වල අතිරේක බෝග වගාව සඳහා රටකජු හා තල බෝග බෙදා හැර ඇත.

04.එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය

පහත රට වියළි කලාපයට අයත් මෙම එල්ලංගාවේ මහ කන්නය සඳහා හො ජලය ලැබෙන අතර යල කන්නයේ දී වැව් වල පවතින ජලය මනා කළමනාකරණයකින් යුක්තව බෙදා ගැනීම තුලින් වගා කටයුතු සඳහා යොදා ගනී. බොහෝ විට මහ කන්නයේ දී වැව් ආශ්‍රිත සියලු ගොඩ මඩ ඉඩම් වගා කලද යල කන්නයේ දී යල බෙත්ම ක්‍රමය යටතේ වගා කටයුතු සිදු කරයි. භූ විෂමතාව අනුව වැවෙන් ජලය ලබා ගත හැකි වගාබිම් වල පමණක් දැඩි කළමණාකරණයක් යටතේ ජලය ලබා ගෙන වගා කරයි. ගොවි සංවිධානයේ මැදිහත් වීම මත ජලය බෙදා හැරීමක් සිදුවේ. කන්න රැස්වීම අනුව වගාව ආරම්භ කර ජල මුර ක්‍රමයට ජලය නිකුත් කෙරේ. වගා කන්නය සමඟ වාරි මාර්ග පද්ධතිය නඩත්තු වන අතර සෙසු කාල වල නඩත්තුවක් නොමැත. එල්ලංගාව තුළ ගොවි සංවිධාන වල ක්‍රියාකාරිත්වය වගා කන්නයට පමණක් සීමා වේ.

4.1 එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග

ආවිරිගම එල්ලංගාව පහත සඳහන් අභියෝගයන්ට මුහුණ දෙමින් සිටී. හරස්කඩ චාරිකාවේ දී මෙන්ම ගොවි සංවිධාන, එල්ලංගා කළමනාකරණ කමිටුව හා නිලධාරීන් ක්ෂේත්‍ර චාරිකාවල දී හඳුනාගත් මෙම ගැටලු විශේෂ ස්ථානයක් ගනී. තවද එල්ලංගා පැතිකඩ වාර්ථාවට අනුව පහත අභියෝගයන් හඳුනාගෙන ඇත.

01. වැව් ඉස්මත්තේ ඇති පාංශු ඛාදනය වැළැක්වීමට පියවර ගත යුතුය.
විශේෂයෙන්ම වැටි ඉදි කිරීම.
වැව් වලට ඉහළින් පිහිටි වගා බිම් වලට සිදු වන පාංශු ඛාදනය නිසා වැවට මඩ එකතු වී වැව් ගොඩවීම සිදු වේ. උදාහරණ ලෙස,

   i. මියල්ලෑව වැව - 150m
   ii. බෝගහවැව වැව - 200m
   iii. කොටු වැල්ලෑව වැව -180m
   iv. නවගත්තේගම වැව - 120m
   v. ආවිරිගම වැව - 170m
   vi. ගොවිපල්ලිය වැව - 120m

02. වැව් වල ඉස්මත්ත හා රක්ශිත මිනිසුන් විසින් අනවසරෙන් අල්ලා ගෙන ඇත.
ඉස්මත්තේ ගෙවල්, කුඹුරු, පොල් වතු ඇත. (ආවිරිගම වැව, ගොවිපල්ලිය වැව)

03. වැව් තාවුල්ල අනවසරයෙන් අල්ලාගෙන කුඹුරු අස්වද්දා තිබේ.

   a. මියල්ලෑව අක්.03
   b. ආවිරිගම අක්.04
   c. ගොවිපල්ලිය අක්.06
   d. නවගත්තේගම අක්.08
   e. කිරිමැටියාව අක්.1.8

ආවිරිගම වැවේ ගොඩවල ඇතත් එය දැනට ප්‍රතිසංස්කරණය කළ යුතු මට්ටමක ඇත.
ආවිරිගම වැවේ ගොඩවල ගොඩවීම නිසා අපද්‍රව්‍ය වැවට එකතු වීම.

04. රක්ෂිත ප්‍රදේශ මිනිසුන් විසින් අල්ලා ගෙන ඇත.

05. සොරොව් වලින් වතුර කාන්දු වීම සිදු වේ.
එය ඉදිරියේදී ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කිරීම සිදු කරයි.

   a. මියල්ලෑව වැව
   b. කිරිමැටියාව වැව

c. නවගත්තේගම වැව

d. හීනාගම වැව

e. ආවිරිගම වැව

ඉදිරියේදී පුනරුත්තාපනය වේ.

06. සියලුම වැව් සඳහා වැව් ඉස්මත්තේ පෙරහනක් තිබීම අවශ්‍යයි.

කුඹුරු වගාව නිසා වැව ගොඩ වීම ප්‍රශ්න නැත.

07. සියලුම වැව් වල කට්ට කඩුව නැත.

08. වැව් ජලජ ශාක වලින් වැසී තිබේ.

A. නවගත්තේගම වැව - 40%

B. හීනාගම වැව - 20%

C.ආවිරිගම වැව - 35%

D.මියල්ලෑව වැව - 20%

10. අලින්ගෙන් සිදුවන බලපෑම නිසා මිනිස් ජීවිත හා වගාවන් විනාශ කරයි.

4.2 හඳුනාගත් ගැටලු අතරින් සැලකිල්ලට භාජනය කළ උග්‍ර ගැටළු

අනු අංකය	උග්‍ර ගැටළුව	විසඳුම් හා යෝජනා
1	වැව් ඉස්මත්තේ ඇති පාංශු ඛාදනය වැළැක්වීමට පියවර ගත යුතුය. විශේෂයෙන්ම වැටි ඉදි කිරීම සඳහා වැව් වලට ඉහළින් පිහිටි වගා බිම් වලට සිදු වන පාංශු ඛාදනය නිසා වැවට මඩ එකතු වී වැව් ගොඩවීම සිදු වේ. උදාහරණ ලෙස, i. මියල්ලෑව වැව - 150m ii. බෝගහවැව වැව - 200m iii. කොටු වැල්ලෑව වැව - 180m iv. නවගත්තේගම වැව - 120m v. ආවිරිගම වැව - 170m vi. ගොවිපල්ලිය වැව - 120m	පාංශු ඛාදනය ආරක්ෂිත වැටි දැමීම.
2	වැව් වල ඉස්මත්ත හා රක්ශිත මිනිසුන් විසින් අනවසරෙන් අල්ලා ගෙන ඇත. ඉස්මත්තේ ගෙවල්, කුඹුරු, පොල් වතු ඇත. (ආවිරිගම වැව, ගොවිපල්ලිය වැව)	වැව මැන අනවසරකරුවන් ඉවත් කිරීම.
3	වැව් තාවුල්ල අනවසරයෙන් අල්ලාගෙන කුඹුරු අස්වද්දා තිබේ. I. මියල්ලෑව අක්.03 II. ආවිරිගම අක්.04 III. ගොවිපල්ලිය අක්.06 IV. නවගත්තේගම අක්.08 V. කිරිමැටියාව අක්.1.8 (ආවිරිගම වැවේ ගොඩවල ඇතත් එය දැනට ප්‍රතිසංස්කරණය කළ යුතු මට්ටමක ඇත.)	වැව මැන අනවසරකරුවන් ඉවත් කිරීම.

4	ආවිරිගම වැවේ ගොඩවල ගොඩවීම නිසා අපද්‍රව්‍ය වැවට එකතු වීම.	ගොඩවල ප්‍රතිසංස්කරණය කිරීම සහ අවශ්‍ය ස්තාන වල වැටි දැමීම.
5	රක්ෂිත ප්‍රදේශ මිනිසුන් විසින් අල්ලා ගෙන ඇත.	වැව මැන අනවසරකරුවන් ඉවත් කිරීම.
6	සොරොව් වලින් වතුර කාන්දු වීම සිදු වේ. එය ඉදිරියේදී ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කිරීම සිදු කරයි. I. මියල්ලෑව වැව II. කිරිමැටියාව වැව III. නවගත්තේගම වැව IV. හීනාගම වැව V. ආවිරිගම වැව ඉදිරියේදී පුනරුත්තාපනය වේ.	ඉදිරියේදී පුනරුත්තාපන කටයුතු වලදී සිදු කෙරේ.
7	සියලුම වැව් සඳහා වැව් ඉස්මත්තේ පෙරහනක් තිබීම අවශ්‍යයි. කුඹුරු වගාව නිසා වැව ගොඩ වීම ප්‍රශ්න නැත.	පෙරහන් දැමීම සහ ආරක්ශිත වැටි දැමීම.
8	සියලුම වැව් වල කට්ට කඩුව නැත.	කට්ට කඩුව දැමීම.
9	වැව් ජලජ ශාක වලින් වැසී තිබේ. I. නවගත්තේගම වැව - 40% II. හීනාගම වැව - 20% III. ආවිරිගම වැව - 35% IV. මියල්ලෑව වැව - 20%	ජලජ ශාක ඉවත් කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

10	අලින්ගෙන් සිදුවන බලපෑම නිසා මිනිස් ජීවිත හා වගාවන් විනාශ කරයි.	අලි වැටවල් ඉදි කිරීම.

වගුව - 07

4.3 ආවිරිගම හරස්කඩ චාරිකාවෙන් හදුනාගත් ප්‍රමුඛතාගත කල ගැටලු හා යෝජිත උපාය මාර්ග හා සැලැස්ම

එල්ලංගා කළමණාකරන කමිටුව විසින් උග්‍ර ගැටළු විසඳා ගැනීම හෝ අවම කිරීම සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම්

අනු අංක	උග්‍ර ගැටළු	යෝජිත උපාය මාර්ග හා සැලැස්ම	මැදිහත් විය යුතු ආයතන
1	වැව් ඉස්මත්තේ ඇති පාංශු ඛාදනය වැළැක්වීමට පියවර ගත යුතුය. විශේෂයෙන්ම වැටි ඉදි කිරීම. වැව් වලට ඉහළින් පිහිටි වගා බිම් වලට සිදු වන පාංශු ඛාදනය නිසා වැවට මඩ එකතු වී වැව් ගොඩවීම සිදු වේ. උදාහරණ ලෙස, මියල්ලැව වැව - 150m බෝගහවැව වැව - 200m කොටු වැල්ලැව වැව - 180m නවගත්තේගම වැව - 120m ආවිරිගම වැව - 170m ගොවිපල්ලිය වැව - 120m	පාංශු ඛාදනය සඳහා ආරක්ෂිත වැටි දැමීම.	ගොවි සංවිධාන, දේශගුන සුහුරු ව්‍යාපෘතිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෘශිකර්ම දෙපාර්තුමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව.

2	වැව් වල ඉස්මත්ත හා රක්ශිත මිනිසුන් විසින් අනවසරෙන් අල්ලා ගෙන ඇත. ඉස්මත්තේ ගෙවල්, කුඹුරු, පොල් වතු ඇත. (ආවිරිගම වැව, ගොවිපල්ලිය වැව)	වැව මැන අනවසරකරුවන් ඉවත් කිරීම.	ගොවි සංවිධාන, දේශගුන සුහුරු ව්‍යාපෘතිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෘශිකර්ම දෙපාර්තුමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව, වන සංරක්ශන දෙපාර්තුමේන්තුව.
3	වැව් තාවුල්ල අනවසරයෙන් අල්ලාගෙන කුඹුරු අස්වද්දා තිබේ. මියල්ලෑව අක්.03 ආවිරිගම අක්.04 ගොවිපල්ලිය අක්.06 නවගත්තේගම අක්.08 කිරිමැටියාව අක්.1.8 (ආවිරිගම වැවේ ගොඩවල ඇතත් එය දැනට ප්‍රතිසංස්කරණය කළ යුතු මට්ටමක ඇත.)	වැව මැන අනවසරකරුවන් ඉවත් කිරීම.	ගොවි සංවිධාන, දේශගුන සුහුරු ව්‍යාපෘතිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෘශිකර්ම දෙපාර්තුමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව, වන සංරක්ශන දෙපාර්තුමේන්තුව..

4	ආවිරිගම වැවේ ගොඩවල ගොඩවීම නිසා අපද්‍රව්‍ය වැවට එකතු වීම.	ගොඩවල ප්‍රතිසංස්කරණය කිරීම සහ අවශ්‍ය ස්තාන වල වැටි දැමීම.	ගොවි සංවිධාන, දේශගුන සුහුරු ව්‍යාපෘතිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව, පලාත් වාරිමාර්ග දෙපාර්තුමේන්තුව.
5	රක්ෂිත ප්‍රදේශ මිනිසුන් විසින් අල්ලා ගෙන ඇත.	වැව මැන අනවසරකරුවන් ඉවත් කිරීම.	ගොවි සංවිධාන, දේශගුන සුහුරු ව්‍යාපෘතිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව, වන සංරක්ශන දෙපාර්තුමේන්තුව.
6	සොරොව් වලින් වතුර කාන්දු වීම සිදු වේ.	ඉදිරියේදී පුනරුත්තාපන කටයුතු වලදී සිදු කෙරේ.	ගොවි සංවිධාන, දේශගුන සුහුරු ව්‍යාපෘතිය,

	එය ඉදිරියේදී ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කිරීම සිදු කරයි. මියල්ලෑව වැව කිරිමැටියාව වැව නවගත්තේගම වැව හීනාගම වැව ආවිරිගම වැව ඉදිරියේදී පුනරුත්තාපනය වේ.		ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව, පලාත් වාරිමාර්ග දෙපාර්තුමේන්තුව.
7	සියලුම වැව් සඳහා වැව් ඉස්මත්තේ පෙරහනක් තිබීම අවශ්‍යයි. කුඹුරු වගාව නිස වැව ගොඩ වීම ප්‍රශ්න නැත.	පෙරහන් දැමීම සහ ආරක්ශිත වැටි දැමීම.	ගොවි සංවිධාන, දේශගුන සුහුරු ව්‍යාපෘතිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව, වන සංරක්ශන දෙපාර්තුමේන්තුව.
8	සියලුම වැව් වල කට්ට කඩුව නැත.	කට්ට කඩුව දැමීම.	ගොවි සංවිධාන, දේශගුන සුහුරු ව්‍යාපෘතිය,

			ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව, වන සංරක්ශන දෙපාර්තුමේන්තුව.
9	වැව් ජලජ ශාක වල්න් වැසී තිබේ. නවගත්තේගම වැව - 40% හීනාගම වැව - 20% ආවිරිගම වැව - 35% මියල්ලෑව වැව - 20%	ජලජ ශාක ඉවත් කිරීම සදහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.	ගොවි සංවිධාන, දේශගුන සුහුරු ව්‍යාපෘතිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව, වන සංරක්ශන දෙපාර්තුමේන්තුව.

10	අලින්ගෙන් සිදුවන බලපෑම නිසා මිනිස් ජීවිත හා වගාවන් විනාශ කරයි.	අලි වැටවල් ඉදි කිරීම.	ගොවි සංවිධාන, දේශගුන සුහුරු ව්‍යාපෘතිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තුමේන්තුව, වන සංරක්ශන දෙපාර්තුමේන්තුව, වන ජීවී දෙපාර්තුමේන්තුව.

වගුව - 08

05 එල්ලංගා කළමනාකරණයේ මූලික සැලැස්ම

එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම එල්ලංගා කළමණාකරන කමිටුවට එල්ලංගාව සහ ජල පෝෂක ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට මගපෙන්වයි. සහභාගීත්ව ක්‍රමවේද යටතේ සියලු හවුල්කාර ආයතනවල මැදිහත් වීමෙන් එල්ලංගා පැතිකඩෙන් හඳුනාගත් උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සංවර්ධනය කර ඇත. හඳුනාගත් මැදිහත් වීම්, කාලවකවානු, යෝජිත මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන ඇතුලත් Gannt සටහනින් ඉහත කාර්යය පහසු වී ඇත. වගු අංක 07 හි මෙම සටහනට අනුපූර්වකයක් ලෙස එල්ලංගා කළමණාකරන මූලික සැලැස්මේ ඇතුලත් සෑම මැදිහත්වීමක් සඳහාම වැය වන දළ වියදම සහ හවුල්කාර ආයතන, පෞද්ගලික අංශය සහ ප්‍රජා මූල සංවිධාන වලින් අපේක්ෂිත දායකත්වය හා ආධාර ලබාදෙන ආයතන වලින් අපේක්ෂිත මූල්‍ය දායකත්වය දක්වා ඇත. එසේම වගු අංක 08 හි දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති මැදිහත් වීම් වල දළ වියදම හා ක්‍රියාත්මක කිරීමේ කාලවකවානු දක්වා ඇත.

5.1. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය තුල එමගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන ක්‍රියාකාරකම්

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය එහි ව්‍යාපෘති කාලය තුල ආවිරිගම එල්ලංගා කළමණාකරන සැලැස්මේ ඇතුලත් උපාය මාර්ගික මැදිහත්වීම් වලට මූල්‍ය සහාය ලබාදීමට අදහස් කර ඇත. තවද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ කාර්යය මණ්ඩලය හරහා හඳුනාගත් මැදිහත්වීම් සඳහා උප ව්‍යාපෘති වාර්ථා සකස් කිරීමටද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහාය ලබාදෙනු ඇත. එසේම යෝජිත මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින පාර්ශවකාර ආයතන එල්ලංගා කළමණාකරන කමිටුව සමඟ සබඳතාවයකින් යුක්තව කටයුතු කල යුතුය. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් තෝරාගත් මැදිහත්වීම් වල ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ඒවායේ දල වියදම් ඇස්තමේන්තු සහ කාලරාමුව පහත වගුවෙහි දැක්වේ.

5.2 එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය

එල්ලංගා කළමණාකරන කමිටුව විසින් එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවට අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වන අතර එය දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට දැන ගැනීම සඳහා ඉදිරිපත් කල යුතුය. අනුමැතිය ලබා ගැනීමෙන් පසුව එල්ලංගා කළමණාකරන කමිටුව අදාල හවුල්කාර ආයතන වලද සහාය ඇතිව සංකල්ප පත්‍රිකා හෝ උප ව්‍යාපෘති යෝජනා සකස් කර ඒවා මූල්‍ය ආධාර ලබා ගැනීම සඳහා අරමුදල් ලබා දෙන ආයතන වෙත ඉදිරිපත් කල යුතුය. ප්‍රධාන හවුල්කාර ආයතන එනම් හඳුනාගත් මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින ආයතන තාක්ෂණික සැලසුම්, අයවැය වාර්ථා සහ ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස් කර ආධාර ලබාදෙන ආයතන වෙත යෝජනා ඉදිරිපත් කිරීම සඳහා එල්ලංගා කළමණාකරන කමිටුවට සහාය ලබාදිය යුතුවේ. උප ව්‍යාපෘති වාර්තා ක්‍රියාත්මක කිරීමේ තත්වය පිලිබඳ සමාජ විගණනය (Social Auditing) සඳහා ගොවි සංවිධාන වල සහාය ඇතිව ප්‍රතිලාභීන් අතුරින් සමාජ විගණන කමිටු (Social Audit Committees) පත් කර ප්‍රතිලාභීන්ගේද ක්‍රියාකාරී දායකත්වය ලබාගෙන එල්ලංගා කළමණාකරන කමිටුව විසින් ඉටුකරනු ලබන වැඩ වල ගුණාත්මකභාවය ඉහල නංවා ගැනීම සඳහා කටයුතු කල යුතුවේ.

ආවිරිගම ක්‍රියාත්මක සැලැස්ම

	උග්‍ර ගැටළුව	**යෝජිත විසඳුම**	දළ පිරිවැය (රු.මි.)	අ	මැ	ජු	ජූ	අ	සැ	ඔ	නො	දෙ		අදහස්
1	වැව් ඉස්මත්තේ ඇති පාංශු ඛාදනය වැළැක්වීමට පියවර ගත යුතුය. විශේෂයෙන්ම වැටි ඉදි කිරීම. වැව් වලට ඉහළින් පිහිටි වගා බිම් වලට සිදු වන පාංශු ඛාදනය නිසා වැවට මඩ එකතු වී වැව් ගොඩවීම සිදු වේ. උදාහරණ ලෙස මියල්ලෑව වැව - 150m බෝගහවැව වැව-200m කොටු වැල්ලෑව වැව-180m නවගත්තේගම වැව-120m ආවිරිගම වැව-170m ගොවිපල්ලිය වැව-120m	පාංශු ඛාදනය ආරක්ෂිත වැටි දැමීම.	02											
2	වැව් වල ඉස්මත්ත හා රක්ශිත මිනිසුන් විසින් අනවසරෙන් අල්ලා ගෙන ඇත. ඉස්මත්තේ ගෙවල් කුඹුරු, පොල් වතු ඇත. (ආවිරිගම වැව, ගොවිපල්ලිය වැව)	වැව මැන අනවසර කරුවන් ඉවත් කිරීම.	02											.

3	වැව් තාවුල්ල අනවසරයෙන් අල්ලාගෙන කුඹුරු අස්වද්දා තිබේ. මියල්ලෑව අක්.03 ආච්රිගම අක්.04 ගොව්පල්ලිය අක්.06 නවගත්තේගම අක්.08 කිරිමැටියාව අක්.1.8 ආච්රිගම වැවේ ගොඩවල ඇතත් එය දැනට ප්‍රතිසංස්කරණය කළ යුතු මට්ටමක ඇත.	වැව මැන අනවසර කරුවන් ඉවත් කිරීම.	01											
4	ආච්රිගම වැවේ ගොඩවල ගොඩවීම නිසා අපද්‍රව්‍ය වැවට එකතු වීම.	ගොඩවල ප්‍රතිසංස්කරණය කිරීම සහ අවශ්‍ය ස්ථාන වල වැටි දැමීම.	03											
5	රක්ෂිත ප්‍රදේශ මිනිසුන් විසින් අල්ලා ගෙන ඇත.	වැව මැන අනවසර කරුවන් ඉවත් කිරීම.	01											
6	සොරොව් වලින් වතුර කාන්දු වීම සිදු වේ. එය ඉදිරියේදී ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කිරීම සිදු කරයි.	ඉදිරියේ දී පුනරුත්තාපන	05											

	මියල්ලෑව වැව කිරිමැටියාව වැව නවගත්තේගම වැව හීනාගම වැව ආච්රිගම වැව ඉදිරියේදී පුනරුත්තාපනය වේ.	කටයුතු වලදී සිදු කෙරේ.												
7	සියලුම වැව් සඳහා වැව් ඉස්මත්තේ පෙරහනක් තිබීම අවශ්‍යයි. කුඹුරු වගාව නිසා වැව ගොඩ වීම.	පෙරහන් දැමීම සහ ආරක්ශිත වැටි දැමීම.	02											
8	සියලුම වැව් වල කට්ටකඩුව නැත.	කට්ට කඩුව දැමීම.	02											
9	වැව් ජලජ ශාක වලින් වැසී තිබේ. නවගත්තේගම වැව - 40% හීනාගම වැව - 20% ආච්රිගම වැව - 35% මියල්ලෑව වැව - 20%	ජලජ ශාක ඉවත් කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.	02											

10	අලින්ගෙන් සිදුවන බලපෑම නිසා මිනිස් ජීවිත හා වගාවන් විනාශ කරයි.	අලි වැටවල් ඉදි කිරීම.	05											

වගුව - 08